සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

විද්‍යාව
Science

කාලය පැය 02 යි
02 Hour

නම / විභාග අංකය:
Name/ Index No:

## I - කොටස

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- වඩාත්ම සුදුසු පිළිතුර යටින් ඉරි අඳින්න.

(1) පියවි ඇසට පැහැදිලිව නොපෙනෙන ඉතා කුඩා දේ පැහැදිලිව දැක ගැනීමට භාවිත කළ හැකි උපකරණයකි.
1. දුරේක්ෂය 2. සංයුක්ත අන්වීක්ෂය 3. අත් කාචය 4. ප්‍රිස්ම දෙනෙතිය

(2) වර්ධනය වන දේ පමණක් අඩංගු වරණය වන්නේ.
1. ගොළුබෙල්ලා, මිරිස් පැලය, ගැඩවිලා
2. මුවා, පොල් ගස, උදැල්ල
3. මේසය, කතුර, පූසා
4. කොස් ගස, අලියා, යතුරු පැදිය

(3) ස්වයං පෝෂී ජීවියකු වන්නේ,
1. මිනිසා 2. සමනලයා 3. ගවයා 4. අඹ ගස

(4) ශාක තුළ ආහාර නිෂ්පාදනය කරන ක්‍රියාවලිය හඳුන්වන්නේ,
1. ශ්වසනය ලෙස ය. 2. වර්ධනය ලෙස ය. 3. සංචරණය ලෙස ය. 4.ප්‍රභාසංශ්ලේෂණය ලෙස ය.

(5) ශ්වසන චලන පැහැදිළිව නිරීක්ෂණය කළ හැකි සතෙකි.
1. බල්ලා 2. ගැඩවිලා 3. මදුරුවා 4. ඉබ්බා

(6) 'මුහුදු මල' අයත් වන ජීවී කාණ්ඩය වන්නේ,
1. ශාක 2. සතුන් 3. ක්ෂුද්‍ර ජීවීන් 4. ඇල්ගී

(7) පෝච්චියක සිටවූ ශාකයක්, නිවස තුළ විවෘත ජනේලයක් අසල තබා ඇත. දින කිහිපයකින් එම ශාකය,
1. ජනේලය දෙසට හැරී වැඩේ.
2. ජනේලයෙන් ඉවතට හැරී වැඩේ.
3. ජනේලය දෙසට හෝ ඉන් ඉවතට නොනැමේ.
4. ශාකයේ වර්ධනය නවතී.



(8) නොවිකා ගිලින සතෙක් වන්නේ,
1. රිලවා 2. ගවයා 3. ගිරවා 4. හාවා

(9) ප්‍රභාසංශ්ලේෂණයේදී භාවිතයට ගැනෙන වායුවක් වන්නේ,
1. ඔක්සිජන් 2. නයිට්‍රජන් 3. වාතය 4. කාබන්ඩයොක්සයිඩ්

(10) විෂම පෝෂී ජීවියෙකු ලෙස සැලකිය නොහැක්කේ.
1. බැක්ටීරියා 2. දිලීර 3. පොල් ගස 4. පූසා

(11) ස්කන්ධය මැනීමට යොදාගන්නා අන්තර් ජාතික ඒකකය වන්නේ,
1. කිලෝග්‍රෑම් 2. මීටර 3. තත්පර 4. සෙල්සියස් අංශක



LIVEWORKSHEETS


(12) ශක්ති විශේෂ පමණක් අඩංගු වරණය දැක්වෙන්නේ.

1. ආලෝකය, තාපය, විදුලිය  2. ජලය, තාපය, වාතය  3. වීදුරු, විදුලිය, ආලෝකය  4. රබර්, කඩදාසි, වීදුරු

(13) නිශ්චිත හැඩයක් නැතත්, නිශ්චිත පරිමාවක් ඇති ද්‍රව්‍ය හඳුන්වන්නේ කුමන නමකින් ද?

1. ඝන  2. ද්‍රව  3. වායු  4. පදාර්ථ

(14)




(a) (b)

කුඩා බෝතලයක් ජලය තුළ ගිල්වා පසුව ඇල කිරීම සිදුකෙරේ. මෙම ක්‍රියාකාරකමෙන් තහවුරු කළ හැක්කේ,

1. වාතය අවකාශයේ ඉඩක් ගන්නා බව.
2. ජලය අවකාශයේ ඉඩක් ගන්නා බව
3. බෝතලයකට ජලය පිරවිය හැකි ආකාරය
4. ජලය තුළ වායු බුබුළු පවතින අකාරය

(15) මිනුම් සරාවෙහි අඩංගු ජල පරිමාව,

1. 44ml කි.
2. 45ml කි.
3. 46ml කි.
4. 47ml කි.





(16) ශාකයකට ජලය වැදගත් වන අවස්ථාවක් ලෙස සැලකිය නොහැක්කේ,

1. ඛනිජ ලවණ අවශෝෂණය  2. ප්‍රභාසංශ්ලේෂණය
3. ආහාර ජීර්ණය  4. ශාක දේහය සිසිලනය

(17) ''හිම'' යනු,

1. ජලයේ ඝන අවස්ථාවයි.  2. ජලයේ ද්‍රව අවස්ථාවයි.
3. ජලයේ වායු අවස්ථාවයි.  4. මතුපිට ජලය සඳහා උදාහරණයකි.

(18)




ජලය 100***ml*** (100***g***)  ජලය 100***ml*** (101***g***)  ජලය 100***ml*** (105***g***)


මුහුදෙන්, කලපුවකින් හා ළිඳකින් ලබා ගත් සමාන ජල පරිමාවල ස්කන්ධය මැන A, B හා C යන බීකරවල දමා ඇත. (පිළිවෙලින් නොවේ.) මුහුදු ජලය අඩංගුවන බීකරය වන්නේ,

1. A ය  2. B ය  3. C ය  4. B හෝ C ය

(19) පෘථිවි පෘෂ්ඨයේ ජලය මගින් ආවරණය වී ඇති ප්‍රදේශය,

1. 70%කි.  2. 30% කි.  3. 0.01% කි.  4. 97.4% කි.

(20)




A බඳුනට ගත් ජලය B බඳුනටත්, අනතුරුව B බඳුනෙන් C බඳුනටත් මාරු කිරීම මගින් තහවුරු කළ හැක්කේ,

1. ද්‍රවයකට නිශ්චිත ස්කන්ධයක් ඇති බව.  2. ද්‍රවයකට නිශ්චිත හැඩයක් නොමැති බව.
3. ද්‍රව අවකාශයේ ඉඩක් ගන්නා බව  4. ජලයෙහි විවිධ භෞතික අවස්ථා ඇත


LIVEWORKSHEETS